---

කොත්මලේ ප්‍රාදේශීය සභාව.
නුවරඑළිය දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජූලි 11 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත්කර ඇති කොත්මලේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කළ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.32,834,235ක් වුවද, එය රු.33,963,252ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.1,129,017ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ශේෂය රු.9,999,511ක් වුවද, එය රු.8,212,425ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා එම ණය ශේෂය රු.1,787,086ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය තුල අත්තිකාරම් වශයෙන් ගෙවා තිබූ රු.445,549ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ තැන්පත් ලැබීම් හා තැන්පත් ගෙවීම් වටිනාකම් පිළිවෙළින් රු.2,340,046ක් හා 1,293,048ක් වුවද, එය රු.521,608ක් හා 472,355ක් ලෙස පාලන ගිණුමට ගිණුම්ගත කිරීම නිසා තැන්පත් ගිණුමේ ශේෂය රු.1,064,449ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.1,205,333ක් වුවද, එය රු.752,650ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් රු.452,683ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

(අ). පිළිතුරු නොලත් විගණන විමසුම්.

2013 මැයි 03 දින වන විට විගණන විමසුම් 03 ක් සඳහා පිළිතුරු සපයා නොතිබුණි.

(ආ). තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු. 49,289,066ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,536,147 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,756,425 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය. |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (I). | වරිපනම් හා බදු | 3,802 | 2,602 | 1,200 |
| (II). | බදු කුලී | 269 | 40 | 229 |
| (III) | බලපත්‍ර ගාස්තු. | 2,706 | 2,706 | - |
| (IV). | වෙනත් ආදායම්. | 1,336 | 480 | 856 |

2.2.2 බදු කුලී.

(අ). සභාව සතු තේ ඉඩම් දෙකක් බදු දී තිබුණද, ඊට අදාළව ලිපිගොනුවක් නඩත්තු කර නොතිබූ අතර, 2011 වර්ෂයේ සිට කිසිදු බිල්කිරීමක් හෝ අයවීමක් සිදුවී නොතිබුණි.

(ආ). සභාවට අයත් කටුකිතුල පිහිටි කඩකාමර 03ක් කිසිදු ගිවිසුමකට එළඹීමකින් තොරව බදුදී තිබූ අතර, 2006 දෙසැම්බර් මසට පසුව කිසිදු බදු ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු.

(අ). 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන පරිදි ව්‍යාපාර සඳහා පිරිවැටුම අනුව බලපත්‍ර ගාස්තු අය කළ යුතු වුවද, ඇතැම් ව්‍යාපාරවල පිරිවැටුමට සාපේක්ෂව අයකර තිබූ බලපත්‍ර ගාස්තුව ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය.

(ආ). රම්බෝඩ උපකාර්යාල බලප්‍රදේශයට අයත් ව්‍යාපාර 111කින් රු.93,350ක වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ බදු මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 1,205,333 |
| (ii) | මුද්දර ගාස්තු | 3,078,970 |

2.3 අධිභාර.

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවළුන්ට එරෙහිව ම විසින් ඉකුත් වර්ෂයන් තුල පනවන ලද අධිභාර අනුව 2012 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 0.128ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

2.4 වත්කම් කළමනාකරණය.

2.4.1 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්.

නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව පැවති භෞතික සම්පත් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ). සභාව සතු ගිලන් රථය 2010 ජූලි මාසයේ සිට නිශ්ක්‍රියව තිබුණි.

(ආ). මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ පරිත්‍යාගයක් වශයෙන් ලද අංක RW - 5894 දරන ට්‍රැක්ටර් ට්‍රේලරය ධාවනයේ යෙදවීම සඳහා ට්‍රැක්ටර් රථයක් නොමැතිකම නිසා විවිධ කාලගුණික බලපෑම් වලට නිරාවරණය වෙමින් කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි

(ඇ). සභාව සතු රජයේ නිවාස 06ක් ප්‍රයෝජනයට නොගෙන තිබූ අතර, එයින් මල්දෙණියේ උපකාර්යාලයට අයත් රජයේ නිවාසය ගරාවැටීමට ආසන්නව පැවතුණි.

(ඈ) මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රු.607,617ක වියදමක් දරා ණැනපියස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබාදී තිබුණද, අදාල කාර්යය සඳහා යොදා ගැනීමෙන් තොරව අදාළ උපකරණ කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභාව තුල ගබඩා කර තිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාර් බලයකින් තහවුරු නොවූ ගනුදෙනු.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය යටතේ දක්වා ඇති නියමයන්ට පටහැනිව රු.58,720ක වියදමක් සභාව විසින් දරා තිබුණි.

2.6 අවිධිමත් ගනුදෙනු.

සභාව විසින් වාහන කුලියට ගැනීමේදී තරඟකාරී මිලගණන් කැඳවීමකින් තොරව හා ධාවනය කළ දුර පදනම් කරගෙන ගෙවීම නොකර දිනකට රු.5,000ක් බැගින් රු.535,000ක මුදලක් ගෙවා වාහන කුලියට ගෙන තිබූ අතර, ගමන් වලට අදාළව ධාවන සටහන් ද නඩත්තු කර නොතිබුණි.

2.7 කොන්ත්‍රාත් පරිපාලනය.

ඩන්සිනන් ෆැක්ටරි කොටස මාර්ගය සංවර්ධනය කිරීම.

(අ) ඉහත කර්මාන්තය සඳහා රු.404,270ක මුදලක් ගෙවාතිබූ අතර, ඒ තුළ ඉටු නොකරන ලද වැඩ විෂයයන් 02 ක් සඳහා රු. 42,500 ක් ගෙවා තිබුණු බව 2013 පෙබරවාරි 21 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අනාවරණය විය.

(ආ) මාර්ග තලය සකස් කිරීමේදී පොලිතීන් හා විස්තීරණ මූට්ටු යෙදීම සඳහා ඇස්තමේන්තුකර හා බිල්පත් සකස්කර තිබුණද, අදාල විස්තීරණ මූට්ටු හා පොලිතීන් යෙදීම කර නොතිබුණි.

2.8 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය.

සභාවේ කසළ බහාලීමෙන් පසු පස් දමා වැසීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02කදී රු.340,695ක වියදමක් දරා තිබුණි. මෙසේ වරින් වර විශාල වියදමක් දරමින් අවිධිමත් ලෙස පරිසරයට හානි සිදුවන අන්දමින් අපද්‍රව්‍ය බැහැර කරමින් පැවති අතර, ප්‍රමුඛ කාර්යක් ලෙස අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම පිළිබඳව සභාවේ අවධානය යොමුවිය යුතුව ඇත.

3. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ). ආදායම් පරිපාලනය.
(ඇ). ණය ගැති හා ණය හිමි පාලනය.
(ඈ). සේවක ණය පාලනය.